# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2412/ 08 - 2024 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2024.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

**නිවේදනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද එකී අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා පැවරීම ද නිශ්චය කර ඇති හෙයින්;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2024 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 43127 - 364 (2024/11)

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (*සම්බන්ධිතයි*)

03. බලශක්ති අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ***විෂයයන් හා කාර්යයන්*** | ***දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*** | ***ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්*** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බලශක්ති විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මගින් පුනර්ජනන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය කිරීම<br>5. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාව සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම<br>6. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම<br>7. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම<br>8. බලශක්ති සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම<br>9. ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාව සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම<br>10. විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම | 1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්<br>2. ලංකා විදුලිබල සමාගම<br>3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම<br>4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම<br>5. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව<br>6. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම<br>7. ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය<br>8 සීමාසහිත පොලිප්කෝ ලංකා (පුද්ගලික) සමාගම<br>9. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය<br>10. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය<br>11. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව<br>12. ත්‍රිකුණාමලය ඛනිජතෙල් පර්යන්ත සමාගම | • ලංකා විදුලිබල මණ්ඩල පනත (1969 අංක 17)<br>• ශ්‍රී ලංකා විදුලිබල පනත (2009 අංක 20)<br>• ශ්‍රී ලංකා විදුලිබල පනත (2024 අංක 36)<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961 අංක 28)<br>• ඛනිජතෙල් සම්පත් පනත (2021 අංක 21)<br>• ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)<br>• ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)<br>• ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත ( 2022 අංක 33)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

03. බලශක්ති අමාත්‍ය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 11. පවතින අධික වියදම් සහිත විදුලි උත්පාදන ප්‍රභවයන් අඩු වියදම්, පරිසර හිතකාමී, පුනර්ජනනීය ප්‍රභවයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 12. ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජන සඳහා දේශීය සමාගම්වලට සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම | | |
| 13. කාර්මික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති උත්පාදනය වැඩි කිරීම | | |
| 14. සමුපකාර මූලධර්ම මත පදනම්ව බලශක්ති ඒකක ලෙස ක්ෂුද්‍ර ජාල ස්ථාපිත කිරීම | | |
| 15. බලශක්ති ක්ෂේත්‍රයේ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථා ඇති කිරීම | | |
| 16. විශේෂයෙන්ම පවතින ගිවිසුම් අලුත් කිරීම මගින් කුඩා පරිමාණ ජල විදුලි උත්පාදනය සඳහා නැවත ආයෝජනය කිරීම දිරිමත් කිරීම | | |
| 17. විදුලි බිල යාවත්කාලීන කිරීම සහ ඛනිජ තෙල් සහ ගෑස් සඳහා මිල සූත්‍රය යෙදීම සඳහා වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රමයක් හඳුන්වා දීම | | |
| 18. දිගු කාලීන අවශ්‍යතා මත බලශක්ති උත්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම | | |
| 19. ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 20. විදුලි වාහන භාවිතයට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම | | |
| 21. ශ්‍රී ලංකාව බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා කටයුතු කිරීම | | |
| 22. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම | | |
| 23. ග්‍රාමීය විද්‍යුතනය | | |
| 24. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම | | |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

03. බලශක්ති අමාත්‍ය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ***විෂයයන් හා කාර්යයන්*** | ***දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*** | ***ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්*** |
| සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම<br>25. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු<br>26. ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු<br>27. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන වලට අදාළ කටයුතු, තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම<br>28. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>29. බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම<br>30. තෙල් පිරිපහදු කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පෙට්‍රෝලියම් ද්වි-නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම<br>31. ඉන්ධන සැපයීමේ විශ්වසනීයත්වය, අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම<br>32. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>33. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

04. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ***විෂයයන් හා කාර්යයන්*** | ***දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*** | ***ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්*** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන | 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | • කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46) |